2024.11.29

අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

**බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදයට සහාය ලබා දෙන පාර්ශවයන් විසින් නැවත බෙදුම්වාදී ත්‍රස්තවාද ප්‍රවර්ධනය කිරීම සඳහා රට තුළ ක්‍රියාත්මක වන අන්තවාදි ක්‍රියාවන් පිළිබඳව දැනුවත් කිරීම සහ එම අන්තවාදී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ආණ්ඩුවේ ලිහිල් ප්‍රතිපත්තියට විරෝධය පළකිරීම!**

ඔබතුමන් විසින් පාර්ලිමේන්තුවේ සිදු කරන ලද රාජාසන කතාවේදී ජාතිවාදය, අන්තවාදය යලි හිසෙසවිමට කිසිසේත් ඉඩ නොදෙන බවට කල ප්‍රකාශය, පැසසුම් සහගත ප්‍රකාශයක් වුවත්, එම කතාවේදී බෙදුම්වාදය සම්බන්ධයෙන් එවැනි ස්ථාවරයක් නොදරිම අප වැනි ත්‍රස්තවාදයට එරෙහි යුධයේදී තම ජිවිත කැපකළ රණවිරුවන්ට මහත් ගැටලුවකි.

කෙසේවෙතත්, එම ප්‍රකාශය සිදුකර විනාඩි කිහිපයක් ගතවීමට පෙර එම පාර්ලිමේන්තුවේම නවක මන්ත්‍රීවරයකු විසින් සජීවී වීඩියෝවක් මගින් "ඊලාම් රාජ්‍ය තුළ" , ප්‍රභාකරන් තමන්ගේ දෙවියාය, වැනි අදහස් පවසමින් මෙරටේ තුල නැවත බෙදුම්වාදයට ත්‍රස්තවාදයට වාසිදායක වන ආකාරයට අදහස් ප්‍රකාශ කිරීම හෙළාදකිමි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම් ලබාදීමේදී මේ රටේ භෞමික අඛණ්ඩතාවය, ස්වාධීනත්වය මෙන්ම රට බෙදීමට එරෙහිව වැඩ කටයුතු සිදුනොකරන බවට දිවුරා පොරොන්දු වන මන්ත්‍රීවරයකු පැය කිහිපයක් ඉක්ම යාමට පෙර එම පොරොන්දු සියල්ල කඩ කිරීම තුළ ඔහු තවදුරටත් මන්ත්‍රී ධුරයක් දැරීමට නුසුදුස්සයෙකු වන අතර, ඒ සම්භන්ධයෙන් කතානායකවරයාගේ ක්‍රියාකලාපය, සහ ප්‍රකාශ ඇල්මැරුණු ස්වභාවයක් තිබීම කණගාටුදායකය.

එම මන්ත්‍රීවරයාම ඉන්පදසු දිනයේ රූපවාහිනි නාලිකාවක වැඩසටහනකට එක්වෙමින් "උතුර නැගෙනහිර යනු වෙනත් රටක්, උතුරු නැගෙනහිර ජනතාවට නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවක් නැති බවත, ‘‘ආවා කල්ලිය’’ සමඟ රණවිරුවන් සම්බන්ධයි, ආවා

කල්ලියේ අපරාධ සිදු කරන කල්ලිය ආරක්ෂාව පතා යුද හමුදා කඳවුරු තුළට යනවා" වැනි ප්‍රකාශ සිදුකරමින් මේ රටේ ජනතාව අතර අසත්‍යය පතුරවමින් ජනතාව බිඳවීමේ සහ නැවත බෙදුම්වාදී ත්‍රස්තවාදයට මුල බීජ වැපිරීමේ උත්සාහයක නිරත වෙමින් සිටින පසුබිමක, රටේ සියලුම ජනමාධ්‍ය මෙම සිදුවීම සාක්ෂි සහිතව වාර්තාකර ඇති පසුබිමක, ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස විවිධ පාර්ශව පැමිණිලි කර ඇති පසුබිමක, අතිගරු ජනාධිපතිවරයා ලෙස සහ ආරක්ෂක අමාත්‍යවරයා ඔබතුමාත්, අග්‍රාමාත්‍යවරියත් , ආරක්ෂක අංශත් මේ මන්ත්‍රීවරයාගේ හැසිරීම සම්බන්ධයෙන්, නීතිය ක්‍රියාත්මක නොකර මුනිවත රකින්නේ කුමන කාරණාවක් නිසාදැයි මා හට වටහා ගත නොහැක.

පසුගිය මැතිවරණ කිහිපය තුළ අදාළ මන්ත්‍රීවරයා ඔබ පක්ෂයට සහය ලබාදුන් අයකු බව විවිධ පෝස්ටු මඟින් සහ උතුරේ තොරතුරු මගින් අපට දැනගැනීමට ලැබුණත් මේ රටේ නීතිය සාධාරණත්වය හා සමානාත්මතාවය ආරක්ෂා කිරීමට පොරොන්දු ලබාදුන් ජනාධිපතිවරයකු ලෙස මෙම මන්ත්‍රීවරයාට එරෙහිව නිසි ක්‍රියා මාර්ග ගැනීම ඔබතුමාගේ වගකීමක් බව අවධාරණය කරමි.

තිස් වසරක යුද්ධය නිමා කිරීම සඳහා ජීවිත පූජා කළ, ලේ ඇට නහර ජීවිත කැප කරමින් ආබාධිත වූ මා වැනි රණවිරුවන්ගේ ආත්ම ගරුත්වය සහ ඔවුන්ගේ ආත්මාභිමානය ආරක්ෂා කිරීම ජනාධිපතිවරයා ලෙස ඔබතුමාගේ වගකීමක් වන්නේ, අද අපේ රට නිදහසේ සාමකාමීව ජීවත්විය හැකි රාජ්‍යක් බවට පත්වූයේ අපවැනි රණවිරුවන් සිය පණ දෙවෙනි කොට මව්බිම වෙනුවෙන් සිදුකළ ඒ කැපකිරීම නිසාය.

අතිගරු ජනාධිපතිතුමනි,

උතුරේ සහෝදර දෙමළ ජනතාව තිස් වසරක යුධයෙන් මියගිය සිය ඥාතීන් සැමරීම සම්බන්ධයෙන් අපට කිසිදු විරෝධතාවයක් නොමැත.

නමුත් අපට ලැබෙමින් පවතින තොරතුරු අනුව 2009 යුද්ධය අවසන් වීමෙන් පසුව ඉතාම උත්කර්ෂවත් අන්දමින් රට තුල තහනම් සංවිධානයක් ලෙස නම් කර ඇති, කොටි සංවිධානයේ මහා විරු සතිය සමරනු ලැබුනේ පසුගිය සතියේදීය. මෙම උත්සව සංවිධානය වී තිබුනේ කොටි සංවිධානයේ හිටපු සාමාජිකයින් මෙන්ම අදටත් බෙදුම් වාදය වෙනුවෙන් උතුරේ අදහස් වපුරමින් ක්‍රියාකාරීව කටයුතු කරන පිරිස් ය. දෙමළ කොටි ත්‍රස්ත සංවිධානයේ ස්මාරක තනමින්, ඒ සඳහා කොටි සංවිධානයේ නිල වර්ණ වන කහ සහ රතු පැහැය භාවිතා කරමින්, කොටි සංවිධානයේ නිල පුෂ්පය වන "නියඟලා" මල ඇතුළු සැරසිලි රැසක්, භාවිතා කරමින් ඔවුන් විසින් උත්කර්ෂවත් ලෙස මහා විරු සතිය සැමරූහ.

මෙහිදී යුද්ධයේදී මියගිය තම ඥාතීන් සැමරීමට එහා ගිය දෙමල ඊලාම් බෙදුම්වාදී දෘෂ්ටිවාදයේ දේපාලන ප්‍රචාරණයක් සිදු වූ බව නිරීක්ෂණය විය.

එහිදී ඔවුන්ගේ වෙනම රාජ්‍ය සංකල්පය අත්හැර නොමැතිබවද එම ප්‍රකාශ වලින් පැහැදිලි විය.

තවද පසුගිය 2024.11.26 වන දින අරුණ ජාතික පුවත්පතේ මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් මියගිය පිරිස් සැමරීමේදී ලාංචන, කොඩි පුවරු භාවිතය සාධාරණිකරණය කිරීම සහ ධීවර කටයුතු අමාත්‍ය රාමලිංගම් චන්ද්‍රසේකරන් විසින් විසින් උතුරේ පුවත්පතකට ප්‍රකාශ කර සිටි මියගිය කොටි සාමාජිකයින් සැමරීම සඳහා රජයේ කිසිම බාධාවක් නැති බවත් පොලිසියට සහ හමුදාවට එම සැමරුම් වල ඡායාරූප නොගැනීමට සහ තොරතුරු සොයා නොයන ලෙස අණකර ඇති බවටත් කර ඇති ප්‍රකාශය ගැන විරෝධතාවය පලකරමි.



Eelanadu வார மலர் ஈழநாடு

Email : news@eelanadu.lk மலர் : 05 24.11.2024 ஞாயிற்றுக்கிழமை

# தமிழ் மக்கள் மாவீரர்களை நினைவேந்த தடையில்லை!

**அமைச்சர் இராமலிங்கம் சந்திரசேகர்**

யாழ்ப்பாணம், நவம்பர் 24

"தமிழ் மக்கள் மாவீரர் வாரத்தை அனுஷ்டிப்பதற்கு எந்த வித தடையும் கிடையாது. அவர்கள் நினைவேந்தல் நிகழ்வுகளை நடத்தமுடியும். நினைவேந்தல் நிகழ்வுகளில் பங்கேற்பவர்களை ஒளிப்படம் எடுக்கவேண்டாம் என பாதுகாப்புத் தரப்பினருக்கும் அறிவுறுத்தப்பட்டுள்ளது."

- இவ்வாறு தெரிவித்துள்ளார் அனுரகுமார திஸாநாயக்க தலைமையிலான புதிய அரசின் கடற்றொழில் நீரியல் வள அபிவிருத்தி அமைச்சர் இராமலிங்கம் சந்திரசேகர்.

சகோதர ஊடகமான டான் தொலைக்காட்சியின் ஸ்பொட்லைட் அரசியல் நிகழ்ச்சியில் பங்கேற்று கருத்து வெளியிடும்போதே அவர் இவ்வாறு கூறினார்.

அவர் அதில் மேலும் தெரிவிக்கையில்-

மாவீரர் தினத்தை தமிழ் மக்கள் இம்முறை எந்தவிதமான கெடுபிடிகளும்

15

මියගිය සිය ඥාතීන් සැමරීම මුවාවෙන් බෙදුම්වාදී අන්තවාදි පාර්ශවයන් යාපනය සරසවිය ඇතුළු ස්ථාන කිහිපයක් තුළ ඉතා අත්තනෝමතික ආකාරයෙන් කොටි ත්‍රස්තවාදින් සැමරීම සහ මියගිය ත්‍රස්තවාදී නායක වේළුපිල්ලේ ප්‍රභාකරන් උපන් දිනය සැමරීම මේ රටට ආදරය කරන රණවිරුවෙක් ලෙස හෙළා දකිමි. අන්තවාදයට උඩගෙඩි දෙන ඩයස්පෝරා මුදලින් යැපෙන හිටපු මන්ත්‍රීවරුන් සහ ත්‍රස්තවාදයට උඩගෙඩි දෙන පාර්ශවයන් එක්ව සැලසුම් සහගතව සිදු කරන මේ ක්‍රියාදාමයන් වහාම නැවැත්විය යුතු බව මගේ අදහසයි.






අතිගරු ජනාධිපතිතුමනි,

එල්.ටී.ටී.ඊ සංවිධානය යනු මෙරටේ පහනම් කරන ලද සංවිධානයක් බවත් එම සංවිධානයේ නායකයන් අනුස්මරණය කිරීම හෝ එම සංවිධානය නමින් මියගිය සාමාජිකයන් අනුස්මරණය කිරීම මෙරටේ උත්තරීතර නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වරදක් වන පසුබිමක අන් කවරදාටත් වඩා මේ වසරේ මෙම සැමරුම් ශ්‍රී ලංකාව තුළ සිදුවීම අපගේ විමතියට හේතුවන කරුණක් වන්නේ අන් කිසිවක් නිසා නොව ජාතිවාදයට වර්ගවාදයට කිසිදු ඉඩක් නොමැති බව පාර්ලිමේන්තුව තුළ ඉතා පැහැදිලිව ප්‍රකාශ කළ ඔබතුමා මෙවැනි සිදුවීම් පිළිබඳව මුනිවත රකින නිසාවෙනි.

එබැවින් මේ පිළිබඳව කරුණු සොයා බලා අදාල අංශ දැනුවත් කරන ලෙසත් එක මවකගේ දරු කැලක් ලෙස ජීවත්වෙන අපේ රටේ සාමයට බාධා කරන සියලු පාර්ශ්වයන්වලට එරෙහිව වහා පියවර ගන්නා ලෙසත් මම ඔබතුමාගෙන් සියලු රණවිරුවන් වෙනුවෙන් ඉල්ලා සිටිමි.

**ඩබ්ලිව්.ඇම්.ඩී මංජුල**

**(අබාදිත රණවිරු(විශ්‍රාමික), සිංහ රෙගිමේන්තුව, ශ්‍රී ලංකා යුධ හමුදාව)**

**නො 26, මහා විහාර පාර, ලක්‍ෂපතිය, මොරටුව.**